

පාකෙන්හම් හි නව විවෘත ස්ථාන ගොඩනැගෙමින් පවතී.

**පාකෙන්හම්**, 2024 ඔක්තෝබර්

# පාකෙන්හම් හි වෙනස්වීම නොවැම්බර් මාසයේ දී සම්පූර්ණ වනු ඇත

## දැන් මේන් ස්ට්‍රීට්, මැක්ග්‍රෙගර් රෝඩ් සහ රේස්කෝර්ස් රෝඩ්, දුම්රිය හරහා දිවෙන පාරවලින් තොර අතර පාකෙන්හම් සහ පාකෙන්හම් ඊස්ට් දුම්රිය ස්ථාන විවෘතය, අපි දැන් එම්.සී.ජී. මෙන් හය ගුණයක් විශාල විවෘත අවකාශ නිර්මාණය කරමින් සිටිමු.

ගිම්හාන ඍතුවේදී මෙම ප්‍රදේශය විවෘත කිරීමේදී ප්‍රජාව හට දැකීමට සහ කිරීමට නව පාකෙන්හම් දුම්රිය ස්ථානයේ සහ නව විවෘත අවකාශවල බොහෝ දේ ඇත. බයිසිකල් සහ ඇවිදීමට මංපෙත්, බාබෙකිව් ප්‍රදේශයක්, ක්‍රීඩා පිටියක්, ගෙවතු ප්‍රදේශ, අර්ධ පැසිපන්දු පිටියක් සහ ව්‍යයාම උපකරණ සහිත නව ආකාරයට වෙනස්වුණු පරිසරයක් පළාත්වාසීන්ට සහ පරම්පරා ගණනාවකට භුක්ති විඳීමට හැකිවනු ඇත.

මේන් ස්ට්‍රීට් සහ මැක්ග්‍රෙගර් රෝඩ් නැවත විවෘත වීමත් සමගම පාකෙන්හම් දුම්රිය ස්ථානයේ වැඩ කටයුතු දිගටම සිදු කෙරේ.

නොවැම්බර් මස මැද සිට, සම්පූර්ණ කරන ලද පාකෙන්හම් දුම්රිය ස්ථානය රේල්වේ ඇවිනියු වෙතින් පැමිණෙන බස් රථ හුවමාරු මධ්‍යස්ථානයක්, රථ වාහන සඳහා 866 ක ඉඩකඩ, සංවෘත සහ කාලගුණය පාලනය කරන නැවතීමේ කාමරයක් සහ මහජන වැසිකිළි දැකගත හැකිවනු ඇත.

මෙම දුම්රිය හරහා දිවෙන බූම් ගේට්ටු ඉවත් කිරීම සමඟ, 2025 දී පාකෙන්හම් මාර්ගය, දුම්රිය හරහා දිවෙන මාර්ගවලින් තොරවේ.

### ව්‍යාපෘතියේ ප්‍රතිලාභ

- පාකෙන්හම් සහ ඊස්ට් පාකෙන්හම්හි නවතම දුම්රිය ස්ථාන
- මැක්ග්‍රෙගර් රෝඩ්, මේන් ස්ට්‍රීට් සහ රේස්කෝර්ස් රෝඩ් හි ඇති බූම් ගේට්ටු සදහටම ඉවත්ව යනු ඇත
- උදෑසන ජනාකීර්ණම වේලාවල මිනිත්තු 30 කට අධික බූම් ගේට්ටු නිසා වසා තබන කාලය ඉවත්ව යනු ඇත
- සෑම සතියේ දිනකම වාහන 63,000 ක ගමන් කාලය ඉතිරි කරනු ඇත
- පොදු ප්‍රවාහන සේවාවලට වැඩිපුර ප්‍රවේශය
- පාකෙන්හම් අවට ප්‍රදේශයේ වැඩි ආරක්ෂාව සහ වඩා යහපත් ප්‍රවාහන සම්බන්ධතා
- එම්.සී.ජී. හයක ප්‍රමාණයක නව ප්‍රජා විවෘත අවකාශ

යාවත්කාලීන සඳහා අනුසන් කරන්න
levelcrossings.vic.gov.au

# පාකෙන්හම් හි වගා කිරීම

## පාකෙන්හම් දුම්රිය ස්ථානය සහ නව විවෘත අවකාශ පුරා ශාඛ, පඳුරු සහ තෘණ වර්ග 270,000 ක් පමණ වගා කරනු ඇත.

ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථාන පරිශ්‍රය වටා, අප විසින් ශාඛ, පඳුරු සහ තෘණ වර්ග 60,000 කට වඩා සිටුවා ඇත. දුම්රිය ස්ථානය වෙත ඇවිදීමට හෝ බයිසිකලයෙන් යාම සඳහා රයන් රෝඩ් හි බෙදාහදාගෙන භාවිතා කල හැකි මංපෙතක් ගොඩනගා ඇත.

පාකෙන්හම් සහ ඊස්ට් පාකෙන්හම් හි ශාඛ, පඳුරු සහ තෘණ වර්ග විශේෂ 40 කට වඩා සිටුවමින් පවතී. මෙම විශේෂ අතර මානා ගම්. නේටිව් අයිරිස් සහ ලෙමන් සෙන්ටඩ් ගම් ඇත.

**334,250**

*ක් ශාඛ, පඳුරු සහ තෘණ වර්ග මුළු ව්‍යාපෘතිය පුරා සිටුවනු ඇත.*

> **මෙම ගිම්හාන ඍතුවේදී විවෘත අවකාශය සහ භූදර්ශනය සැම දෙනාටම භුක්ති විඳීම සඳහා සූදානම් වනු ඇත.**



*ශාර්නෙට් සර්කිට් වෙත ඇතුළුවන ස්ථානයට පිටත සිට ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථානය තෙක් පැල සිටුවීම.*


*මානා ගම්.*


*නේටිව් අයිරිස්.*


*ලෙමන් සෙන්ටඩ් ගම්.*


*පාකෙන්හම් දුම්රිය ස්ථානය දෙස බලන දුම්රිය පාලමේ උතුරු පස ක්‍රියාශීලී අවකාශයේ වැඩුණු ගස් ඇත. චිත්‍ර ශිල්පියාගේ අදහස පමණි. වෙනස් වීමට ඉඩ ඇත.*

### විවෘත අවකාශ සිතියම බලන්න

කේතය ස්කෑන් කරන්න නැතිනම් **bigbuild.vic.gov.au/pakenham-open-space-roll-plot** වෙත පිවිසෙන්න.




ක්‍රීඩා සහ විනෝද ක්‍රීඩා අවකාශය බලා සිටින්නේ බටහිර දෙසට මැක්ග්‍රෙගර් පාර දෙසටය. චිත්‍ර ශිල්පියාගේ අදහස පමණක් වන අතර වෙනස්වීමට ඉඩ ඇත.

# පාකෙන්හම් වෙත පැමිණෙන දේ


## ප්‍රජා විවෘත අවකාශ

### පාකෙන්හම් පළාත්වාසීන් හට පරම්පරා ගණනාවකට භුක්ති විඳීම සඳහා අවකාශයක් නිර්මාණය කිරීම සඳහා වැඩ කටයුතු සිදු වෙමින් පවතී.

2021 දී සිදු කල ප්‍රජා විචාරවලදී ලත් අදහස් 300 ක් උපකාරී කර ගනිමින් එම්.සී.පී. හයක ප්‍රමාණය ඇති ප්‍රජා අවකාශ සැලසුම් කරන ලදී.

ගිම්හාන ඍතුවේදී විවෘත කරන විවෘත අවකාශ අතර පහත දේ ඇත:

- බාබෙකිව් ප්‍රදේශයක්
- බයිසිකල් සහ ඇවිදීමට මංපෙත
- ව්‍යායාම කරන උපකරණ
- අර්ධ පැසිපන්දු පිටියක්,
- ක්‍රීඩා පිටියක්
- ඇඳුම් මාරු කිරීමට පහසුකම්



### බිග් බ්‍රොන්ස් බර්ඩ් ලෙස හැඳින්වෙන *Meet me at the Pakenham Owl* හමුවීමට සූදානමින් සිටින්න.

මීටර් 3.2 උසින් යුතු මීටර් 2.7 ක් පළල් කලා නිර්මාණය පාකෙන්හම් දුම්රිය ස්ථානයට අමතරව එක්වන ප්‍රතිමාවකි. මෙම ප්‍රතිමාව පළාත්වවාසීන් සහ අමුත්තන් හට උනන්දුව ඇති කරවන හමුවීමේ ස්ථානයක් වනු ඇත.

පාකෙන්හම් අවුල් යනු පළාතට සමීප සත්ව විශේෂයක් වන අතර මෙය ග්‍රේටර් සූටි අවුල් හට නෑකම් කියන සමකාලීන නිර්මාණයකි.

මෙම බකමූණා නිර්මාණය කර ඇත්තේ ලේසරවලින් කපන ලද ඇලුමීනියම්වලින් වන අතර මේන් ස්ට්‍රීට් වටරවුම අසළ සවිකරනු ඇත.

මෙම ගිම්හාන ඍතුවේදී ස්ථාපනය කරනු ලබන *Meet me at the Pakenham Owl* අනෙකුත් පළාත්බද නිර්මාණ වන මේන් ස්ට්‍රීට් පාරේ ඇති Yakkerboo සමඟ ආසන්නයේ තිබෙනු ඇත.

වැඩිදුර විස්තර සොයා ගැනීම සඳහා, අපගේ කලා නිර්මාණ විස්තර පත්‍රිකාව පහත පුරුකට පිවිස බලන්න **levelcrossings.vic.gov.au/pakenham**




හිරු උදාවන විට මැක්ග්‍රෙගර් රෝඩ්.

# මේන් ස්ට්‍රීට් සහ මැක්ග්‍රෙගර් රෝඩ්

ව්‍යාපෘතිය අවසාන කිරීමේ විශාල පියවරක් ෙලස, මේන් ස්ට්‍රීට් සහ මැක්ග්‍රෙගර් රෝඩ් අසළ ඇති පැරණි දුම්රිය හරහා දිවෙන මාර්ගවල වැඩ කටයුතු අවසන් කර ඇත.

මේන් ස්ට්‍රීට්හි, නවතම වටරවුම **ජූලි මැද** විවෘත කල අතර **අගෝස්තු** මාසයේදී සංඥා සහ ඉරි ලකුණු කිරීම අවසන් කරන ලදී. වටරවුම මගින් රියදුරන් හට සෙමින් ගමන් කිරීමට උනනදු කිරීම මගින් වාහන ගමනාගමන වන ආකාරය සහ ආරක්ෂාව වැඩි දියුණුවේ.

මැක්ග්‍රෙගර් රෝඩ් හටද පැරණි දුම්රිය පාරවල් ඉවත් කිරීම, සංඥා සහිත මගීන් හට පාර හරහා යා හැකි ආකාරයට සැකසීම, මාර්ගය නැවත ආස්ථරණය කිරීම සහ පාරේ ඉරි ලකුණු කිරීම මගින් නව මුහුණුවරක් ලැබී ඇත.

සංඥා සහිත මාර්ග හරහා මගින් හුවමාරු වන ස්ථානය මෙම වසර අවසානයේ විවෘත කරනු ඇත.

## පාකෙන්හම් වෙත ස්තුතියි

# ප්‍රජා සැමරුම

නොවැම්බර් 16 වන සෙනසුරාදා,
පෙව 11 සිට පව 3 දක්වා

අප විසින් දුම්රිය හරහා දිවෙන පාරවල් තුනක් ඉවත් කිරීම සහ නව දුම්රිය ස්ථාන දෙකක් ගොඩ නැගීම කරන අතර ප්‍රජාව ඉවසා සිටීම සඳහා අප විසින් නොමිළේ ප්‍රජා ඉසව්වක් සූදානම් කර ඇත. එහිදී නොමිළේ කෝපි, ආහාර, ළමුන් හට ක්‍රියාකාරකම්, විනෝදවීමට අවස්ථා සහ තව බොහෝ දේ තිබෙනු ඇත!

BIG BUILD ROADS

## විශාල මාර්ග ගොඩනැගීම

අප විසින් මැක්ග්‍රෙගර් රෝඩ්, හීල්ස්විල්-කූ වී රූප් රෝඩ් සහ ප්‍රින්සස් හයිවේ වැඩි දියුණු කරන අතර පාකෙන්හම් රෝඩ් හි ප්‍රධාන මාර්ග අවහිරවීම් පැමිණෙන මාසවල සිදුවනු ඇත.

ප්‍රමාදයන් මග හරවා ගැනීම සඳහා ඊමේල් සහ කෙටි පණිවුඩ ලබා ගැනීම සඳහා පහත පුරුක වෙත ගොස් අනුසන් කරන්න
**roadprojects.vic.gov.au/subscribe**

## ව්‍යාපෘති කාලවකවානු

### 2019
- ස්ථාන ගවේශණය
- තාක්ෂණික සහ ඉංජිනේරු ඇගයීම
- ප්‍රජා සහභාගිත්වය

### 2021 ආරම්භය
- ප්‍රජා සහභාගිත්වය
- වැඩිදුර ඉංජිනේරු සහභාගිත්වය

### 2021 මැද
- දුම්රිය ස්ථාන සැලසුම් නිවේදනය කිරීම

### 2021 අග
- විවෘත අවකාශ සම්බන්ධ ප්‍රජා සහභාගිත්වය
- කල්තියා කරන වැඩ කටයුතු

### 2022
- ඉදිකිරීම
- විවෘත අවකාශ සැලසුම නිකුත් කිරීම

### 2023
- ඉදිකිරීම

### 2024 මැද භාගය
- වැඩි යහපතට බුම් ගේට්ටු ඉවත්වීම
- පාකෙන්හම් සහ ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථාන විවෘත කිරීම

### 2024 අග භාගය
- පාකෙන්හම් දුම්රිය ස්ථානය සම්පූර්ණවීම
- ප්‍රජා අවකාශ විවෘතවීම

කාලවකවානු වෙනස්වීම්වලට යටත්වේ

**levelcrossings.vic.gov.au**
contact@levelcrossings.vic.gov.au
ඉංග්‍රීසි හැර වෙනත් භාෂා සඳහා කරුණාකර දුරකථන අංක 9209 0147 අමතන්න
1800 105 105 (ඕනෑම වේලාවක අමතන්න)

ඔබට වෙනත් ප්‍රවේශ විය හැකි ආකාරයට විස්තර ලබා ගැනීමට අවශ්‍ය නම්, අප හා සම්බන්ධ වන්න. ශ්‍රව්‍ය හෝ කථන දුෂ්කරතා හේතුවෙන් ඔබට උපකාර අවශ්‍ය නම් **relayservice.gov.au** වෙත පිවිසෙන්න.

VICTORIA State Government

NWP11069